# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2022**
**2024 ඔක්තෝබර් / නොවැම්බර්**

## සමාජීය විද්‍යා පීඨය

## භූගෝල විද්‍යාව
**(නව නිර්දේශය)**

## මානුෂ භූගෝල විද්‍යාව - GEOG 18224

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. 'මානුෂ භූගෝල විද්‍යාවේදී 'භෞතික පරිසරය, මිනිසා සහ මිනිස් ක්‍රියාකාරකම් අතර සම්බන්ධතාව අධ්‍යයනය කරයි' මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 20)

02. මානුෂ භූගෝල විද්‍යාව ස්වාධීන විෂය ශික්ෂණයක් ලෙස වර්ධනය කිරීමට උරදුන් දාර්ශනිකයන් හා ඔවුන් සිදුකළ කාර්යභාරය සමාලෝචනය කරන්න. (ලකුණු 20)

03. භූගෝලීය ඒකීයත්වය හා විවිධත්වය හඳුනාගැනීමට 'සංස්කෘතිය' යන සංකල්පය යොදාගත හැකි ආකාරය දකුණු ආසියානු කලාපය ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 20)

04. අ) 'ගෝලීයකරණය' හඳුන්වන්න. (ලකුණු 02)
ආ) ගෝලීයකරණ ක්‍රියාවලිය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)
ඇ) සම්පත් ව්‍යාප්තියේ විෂමතා හේතුවෙන් ගෝලීයකරණයේ තුලනාත්මක වාසි ඇතිවන ආකාරය උචිත උදාහරණ ඇසුරින් ගෙනහැර දක්වන්න. (ලකුණු 12)

05. අ) ජන සංඛ්‍යා සනත්වය යනුවෙන් කුමක් අදහස් කෙරේද? (ලකුණු 02)
ආ) ජනසංඛ්‍යා ගැටලු ඇතිවීම සඳහා ජනසංඛ්‍යා සනත්වය කෙතෙක්දුරට බලපා තිබේදැයි සාධක හතරක් (04) ඇසුරින් පහදන්න. (ලකුණු 08)
ඇ) 'සංවර්ධනයේ ජනවිද්‍යාත්මක පර්යාවලෝකනය පැහැදිලි කරන්න. (ලකුණු 10)

06. මානව බලපෑම්වල අහිතකර ප්‍රතිවිපාක වායුගෝලය කෙරේ බලපාන ආකාරය උදාහරණ ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 20)

07. අ) 'තිරසර සංවර්ධන අභිමතාර්ථ' යනු කවරේද? (ලකුණු 02)
ආ) ඉහත 07 (අ) හි ඔබ විසින් දැක්වූ අභිමතාර්ථ අටක් (08) නම් කරන්න. (ලකුණු 04)
ඇ) ඉහත 07 (ආ) හි ඔබ විසින් දැක්වූ එක් අරමුණක් තෝරාගෙන එය ගෝලීය සංවර්ධනයට දායකවන ආකාරය පහදන්න. (ලකුණු 14)

08. පහත මාතෘකාවලින් දෙකක් (02) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. භූගෝලීය ඒකීයත්වය සහ විවිධත්වය
ii. ජන සංඛ්‍යාවේ ගතික සංරචක
iii. භූ-දේශපාලන ආර්ථිකය
iv. සංවර්ධිත රටවල පරිසර ගැටලු (ලකුණු 10x2=20)

*********************************